# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DDD/Ho/04/Circular /2017 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................ | දිනය<br>திகதி<br>Date | 2017.04. 07 |

## සමෘද්ධි චක්‍රලේඛ අංක 2017/05/1

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත.

**සමාජ සවිබල ගැන්වීම් හා ග්‍රාම සංවර්ධන වැඩසටහන - 2017**
**" සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන" වැඩසටහන**
**සමෘද්ධි චක්‍රලේඛ අංක 2017/05**

මා විසින් ඔබ වෙත එවන ලද මගේ සමාංක හා 2017.03.08 දිනැති උක්ත චක්‍රලේඛයට අමතර වශයෙනි.

02. සමෘද්ධි නිෂ්පාදන ආදර්ශ ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදි පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමි.

### 2.1 නිෂ්පාදන සංවිධාන පිහිටුවීම

- ආදර්ශ ගම්මානයේ / පොකුරු ගම්මානයේ එක් එක් නිෂ්පාදනයට අදාල සංවිධානයක් තිබිය යුතුය.
- එසේ නොතිබේ නම් නිෂ්පාදනයන් පදනම්ව සංවිධානයක් පිහිටුවා ගතයුතු අතර එය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි විය යුතුය.
- ගම්මානයක නිෂ්පාදනයන් කිහිපයක් ඇති විටෙක හා එහි සමාජිකයින් 07 දෙනෙකුට වැඩි අවස්ථාවක නිෂ්පාදන ගණනට සාපේක්ෂව සංවිධාන පිහිටුවා තිබිය යුතු අතර එම බහුවිධ සංවිධානවල එකතුවෙන් එක් මව් සංගමයක් පිහිටුවා ගත යුතුය.
- පිහිටුවා ගන්නා ලද සංවිධානය හෝ සංවිධානවල ප්‍රතිලාභ එහි සාමාජිකයින් සඳහා පමණක් විය යුතු අතර සමාජිකයින් නොවන ප්‍රතිලාභින් සඳහා ප්‍රතිලාභ හිමි නොවේ.

### 2.2 ප්‍රතිලාභීන් තෝරා ගැනීම

- ප්‍රතිලාභින් තෝරා ගැනිමේදි දැනටමත් එම නිෂ්පාදනයේ යෙදි සිටින ප්‍රතිලාභින් තෝරා ගත යුතු අතර ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක විමේදි ඊට කැමැත්තක් දක්වන සමෘද්ධි ප්‍රතිලාභින්ට ව්‍යාපෘතිය හා සම්බන්ධ විය හැකිය.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya ,Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (මානව සම්පත්)<br>பணிப்பாளர் ( மனிதவளம்)<br>Director (Human Resource) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2873802/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 011-2887280 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | Hot Line: 011- 2887722 |
| E-mail- | dg@divineguma.gov.lk | diradmin@divineguma.gov.lk | finance@divineguma.gov.lk | Hot Line:0112-885582 | |
| | | Hot Line : 0112-889007 | | | |

- තෝරා ගනු ලබන ප්‍රතිලාභීන් අඩු ආදායම්ලාභීන් , කාන්තා ගෘහ මූලික හා අබාධිත පවුල් වලට ප්‍රමුඛ වන සේ සකස්කර නිෂ්පාදන සංවිධානයේ නිර්දේශය ලබා ගත යුතුවේ.

- ආදර්ශ ගම්මානයේ සියළුම ප්‍රතිලාභීන්ගේ ගෘහයන් වෙත ගොස් අවශ්‍යතා හඳුනා ගැනිම හා එය ප්‍රමුඛතාගත කිරිම අත්‍යාවශ්‍ය වනු ඇත.

- ප්‍රතිලාභි අවශ්‍යතා හඳුනා ගැනිමේ ආකෘති පත්‍රය සුදුසු පරිදි දිස්ත්‍රික් අධ්‍යක්ෂ විසින් සකස් කර ගතයුතුවේ.

## 2.3 ව්‍යාපෘති හඳුනා ගැනීම

- ආදර්ශ ගම්මානයක යම් නිෂ්පාදනයක් වැඩිදියුණු කිරිමට ප්‍රාග්ධන භාණ්ඩවල අවශ්‍යතාවන් ඇතිවිට ප්‍රතිලාභියාගේ කැමැත්තට අනුවම පමණක්, අවශ්‍ය ප්‍රාග්ධන උපකරණ ලබා දිය යුතු විම අත්‍යාවශ්‍ය වන අතර මේ පිළිබඳව ප්‍රතිලාභි පොතෙහි විශේෂ සටහනක් තැබිමට සමෘද්ධි සංවර්ධන නිලධාරි විසින් කටයුතු කලයුතු වේ.

- ආදර්ශ ගම්මානයන්හි යටිතල පහසුකම් සංවර්ධනයේදි එය ඍජුවම අදාල නිෂ්පාදනයට බද්ධවූ ව්‍යාපෘති අවශ්‍යතාවයක් සඳහාම විය යුතුය.

- දෙපාර්මේන්තු දායකත්වය රු. 50,000 / කට වඩා වැඩි වන විට ඒ සඳහා අනුමැතිය ලබා ගැනිමට ව්‍යාපෘති වාර්තාවක් සමඟ ඔබගේ නිර්දේශය මා වෙත එවීම අවශ්‍ය වනු ඇත.

- දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක සියළුම වැඩසටහන් ඒකාබද්ධ වූ ග්‍රාම සංවර්ධන සැලැස්මක් තෝරා ගනු ලැබූ සමෘද්ධි ආදර්ශ ගම්මානවල ක්‍රියාත්මක විම ඉතා වැදගත්වනු ඇත.

**මෙම වැඩසටහන සාර්ථක කර ගැනිමට ඔබ ඇතුළු නිලධාරින් දක්වන සහාය ඉතා අගය කොට සලකමි.**

නිල් බණ්ඩාර හපුහින්න
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:-

1. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු අමාත්‍ය එස්.බී දිසානායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන ගරු නියෝජ්‍ය අමාත්‍ය රංජන් රාමනායක මැතිතුමා - කා.දැ.ගැ.පි.
3. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
4. සියළුම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලා - කා.දැ.ගැ.ස.
5. ලේකම්, සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
6. අතිරේක ලේකම් (ග්‍රාමීය සංවර්ධන /සමෘද්ධි), සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
7. ප්‍රාදේශීය ලේකම් .................. -කා.දැ.ගැ.ස හා අ.ක.ස
8. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
9. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
10. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
11. සියළුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස.
12. සමෘද්ධි මූලස්ථාන කළමණාකරු .......................... - අ.ක.ස හා අදාල මහා සංගම් කළමණාකාර අධ්‍යක්ෂ / සමෘද්ධි ව්‍යාපෘති /ප්‍රජා මූල බැංකු කළමණාකරු සහ සමෘද්ධි සංවර්ධන නිලධාරි දැනුවත් කිරීම සඳහා